අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.
Web : www.pmoffice.gov.lk

JCR/SA/PM/2018

2018.03.19

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් ,

මහත්මයාණෙනි/මහත්මියනි

**"තුරුණු දිරිය" තරුණ ව්‍යවසායකයින් සඳහා වන ලංකා බැංකු ණය යෝජනා ක්‍රමය**

කුඩා පරිමාණ ව්‍යවසායකත්ව කටයුතුවල දැනටමත් නියැලී සිටින තරුණ ව්‍යවසායකයින්හට තම ව්‍යාපාර පුළුල් කිරීමට හා ස්ථාවර කර ගැනීමට මූල්‍යමය සහායක් ලබා දීමේ අරමුණින් ලංකා බැංකුව විසින් "තුරුණු දිරිය" නමින් විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබයි. අග්‍රාමාත්‍ය කාර්යාලයට අනුබද්ධිත ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය,කුඩා පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන අංශය හා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශයේ මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකය ,ලංකා බැංකුව සමග පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් මෙම වැඩසටහන දියත් කෙරේ.ලංකා බැංකුව, 2018 මාර්තු 25වන ඉරුදින මෙම ණය යෝජනා ක්‍රමය පුවත්පත් හරහා හඳුන්වා දීමට සැලසුම් කර ඇත .

ණය යෝජනා ක්‍රමයේ පරාමිතීන් පහත පරිදි වේ.

1. අයදුම්කරු 2018/12/31 වන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

2. අයදුම්කරු ව්‍යාපාරය තුල වසර තුනක කාලයක් සක්‍රියව සිටිය යුතු අතර ඕනෑම රජයේ ආයතනයක ,ප්‍රාදේශීය හෝ පළාත් පාලන ආයතනයක ව්‍යාපාරය ලියාපදිංචි වී තිබිය යුතුය.

3. මස 12 ක කාල සීමාවක් සඳහා ගිණුම් අංශයේ වෘත්තිකයෙක් හෝ රජයේ නිළධාරියෙක් විසින් සහතික කළ ගිණුම් සැපයීමට හැකි විය යුතුය.

4. අයදුම්කරු උපාධියක් ,ඩිප්ලෝමාවක් , ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) හෝ වෙනත් පිළිගත් තෘතියික මට්ටමේ සුදුසුකමකින් යුක්ත විය යුතුය.

5. රු.500,000 ක උපරිම ණය අරමුදලක් ලබා ගත හැකි අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුබද්ධිත රජයේ හෝ සංස්ථාවක ව්‍යවස්ථාපිත අධිකාරීලත් නිලධාරියෙක් විසින් සහතික කරන ලද ව්‍යාපාරය දියුණු කිරීම අරමුණු කොටගත් ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.

6. ව්‍යාපාර සැලැස්ම සහතික කරන නිළධාරියා නිර්දේශ කර ප්‍රාදේශීය ලේකම්ට අයදුම්පත යොමු කළ යුතුය.

7. ප්‍රාදේශීය ලේකම් විසින් අයදුම්පතේ අනුක්‍රමික අංකයක් (serial number )සඳහන් කළ යුතු අතර "දිස්ත්‍රික්කය/කොට්ඨාශය /ලංකා බැංකු ශාඛාවේ නම /භාර දුන් දිනය

දුරකථන / தொலைபேசி / Telephones: 2575317 - 18, 2370737 - 38
ෆැක්ස් / தொலைநகல் / Fax: 2575454, 2575310, 2574713
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: secpm@pmoffice.gov.lk, info@pmoffice.gov.lk

/අනුක්‍රමික අංකය" සඳහන් කරමින් එය ලංකා බැංකු ශාඛා කළමනාකරුට භාර දීම පමණක් සිදු කළ යුතුය.

8. ප්‍රාදේශීය ලේකම් විසින් බැංකුවට ලැබෙන අයදුම්පත් ලැයිස්තු ගත කර අදාළ සතියේ වාර්තාවන් මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකයේ cpmunpea@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ 011-2331548 යන ෆැක්ස් අංකයට යොමු කළ යුතුය.

9. මාස 12 ක් සඳහා වන ගිණුම් සකස් කර සහතික කිරීම , ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යොමු කිරීම හා බැංකු ශාඛා කළමනාකරුට ඉදිරිපත් කිරීම යන කටයුතු සඳහා අයදුම්කරුවන්ට සහාය වීමට ,ප්‍රාදේශීය ලේකම් කාර්යයාලවලට අනුබද්ධිත ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය යොමු කරන ලෙස මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා ප්‍රධාන ලේකම්වරුන්ට උපදෙස් දෙනු ලැබේ.

10. රු .200,000ක් දක්වා වන ණය සඳහා ඇපකරුවන් අවශ්‍ය නොවන බවත් රු.500,000ක් දක්වා වන ණය මුදල් සඳහා දෙමාපියන් හෝ පවුලේ සාමාජිකයින්ට ඇපකරුවන් ලෙස පෙනී සිටිය හැකි බවට ලංකා බැංකුව විසින් උපදෙස් දී ඇත.

11. මෙම ණය යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රධාන ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දිස්ත්‍රික් හා / හෝ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන කමිටුවේදී අධීක්ෂණය කළ යුතු අතර ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටළු පිළිබඳව මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකයේ ප්‍රධානී හට දැනුම් දිය යුතු වේ.

මේ සඳහා ඔබගේ සහයෝගය ඉතා අගය කොට සළකමි.

ස්තූතියි

මෙයට විශ්වාසී

.................................................

ජේ.චරිත රත්වත්තේ

ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදේශක

ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාල ප්‍රධානී / මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකක ප්‍රධානී

පිටපත්

1. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2. සියලුම ප්‍රධාන ලේකම්වරුන්,
3. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්